සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

**6 ශ්‍රේණිය** | **කතෝලික ධර්මය** | **කාලය පැය 02 යි**

නම/ විභාග අංකයඃ

## I කොටස

- **1 - 10 දක්වා ප්‍රශ්නවලට වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. දේව ප්‍රසාද නිධානයක ලක්ෂණ පැහැදිලි කළ හැකි දේව ප්‍රසාද නිධානය වන්නේ,

(1) ප්‍රසාද ස්නාපනය (2) දිව්‍ය සත්ප්‍රසාදය

(3) අභිවෘද්ධි ආලේපය (4) පූජකවරය

02. ලන්චියනෝ නුවර දිව්‍ය සත්ප්‍රසාදීය ප්‍රාතිහාර්යය සිදු වූ දෙව් මැදුර අයත් වන්නේ,

(1) ශු. ලොගොන්ෂියන් මුනිතුමන්ට ය. (2) ශු. ජෙරොම් මුනිතුමන්ට ය.

(3) ශු. සෙබස්තියන් මුනිතුමන්ට ය. (4) ශු. පේදුරු තුමන්ට ය.

03. සමගි සන්ධානය දේව ප්‍රසාද නිධානය ලබා ගැනිමට අවශ්‍යය පියවර ගණන වන්නේ,

(1) 3 කි. (2) 10 කි. (3) 5 කි. (4) 7 කි.

04. ''ඔබේ මව විඳි ප්‍රසව වේදනාව කිසි දිනක අමතක නොකරන්න'' යනුවෙන් සඳහන් වන්නේ,

(1) ගීතාවලියේ ය. (2) උත්පත්ති පොතේ ය.

(3) කොලෙස්සි ලිපියේ ය. (4) උපදේශකයා පොතේ ය.

05. නෙබුකද්නශර් රජතුමා රජකම් කරන ලද්දේ,

(1) මිසරයේ ය. (2) බැබිලෝනියේ ය.

(3) ඉශ්‍රායෙලයේ ය. (4) පලස්තිනයේ ය.

06. රූප වන්දනාව තහනම් කරනු ලබන්නේ,

(1) තෙවන පනතින් ය. (2) හතරවන පනතින් ය.

(3) නවවන පනතින් ය. (4) පළමු වන පනතින් ය.

07. අසල්වැසියාට ප්‍රේමය දැක්විමට අපට උගන්වනු ලබන්නේ,

(1) පහ සිට දහය දක්වා පනත් තුළිනි. (2) එකේ සිට දහය දක්වා පනත් තුළිනි.

(3) හතරේ සිට දහය දක්වා පනත් තුළිනි. (4) එකේ සිට තුන දක්වා පනත් තුළිනි.

08. ජේසුස් වහන්සේ පෙන්වා දුන් මග යමින් සතුරන්ට ප්‍රේම කරනු ලැබුවේ,

(1) ශු. දෙවන ජුවාම් පාවුළු මුනිතුමා (2) ශු. අන්තෝනි මුනිතුමා

(3) ශු. ජුසේවාස් මුනිතුමා (4) ශු. පේදුරු තුමා

09. දේව ප්‍රේමය පදනම් කරගනිමින් අන් අයට ප්‍රේම කිරීම සඳහා,

(1) දේව ප්‍රසාද නිධාන ලබා ගත යුතුය. (2) අසරණයන්ට පිහිට විය යුතුය.

(3) වැඩිහිටියන්ට සැලකිය යුතුය. (4) දස පනත අනුසාර කළ යුතුය.

10. කිතුනු විවාහය ආරම්භ කරන ලද්දේ,

(1) මෝසෙස්තුමා විසිනි. (2) විවාහ වන යුවල විසිනි.

(3) දෙවියන් වහන්සේ විසිනි. (4) ආබ්‍රහම්තුමා විසිනි. (ලකුණු 2 x 10 = 20)

- **11 - 15 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

11. කිතුනුවන්ගේ අධ්‍යාත්මික ජීවිතයේ වැඩිවියට පත්වීම .................................................................................. තුළින් පූර්ණත්වයට පත් වේ.

12. .......................................................................... ගෝලයින් මතට ශුද්ධාත්මයාණන් වහන්සේ වැඩම කළ සේක.

13. පූජාප්‍රසාදී තුමන්ලාගේ සේවයට සහය විය හැකි අවස්ථාවක් ලෙස ........................................................ පෙන්වා දිය හැකිය.

14. ශුද්ධවර ප්‍රතිමා අපට ............................................................................................................ සඳහා පහසුවකි.

15. ඉරු දින දිව්‍ය පූජාව තුළින් ...................................................................................... සිහිපත් කරන්නෙමු.

( පාස්කු අභිරහස / යාච්ඤාව / පෙන්තකොස්ත දින / අභිවෘද්ධි ආලේපය / ගීතිකා ගායනා කිරීම.)

(ලකුණු 2 x 5 = 10)

- **16 - 20 තෙක් ප්‍රශ්නවලට දැක්වෙන වගන්ති හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.**

16. අසංවර විලාසිතාවන්ගෙන් සැරසී දිව්‍ය පූජාවට පැමිණිය හැකිය. ( )

17. ශු. ස්තේපන් තුමා සත්‍ය දර්මය ලොවට කියා දීමට ඉදිරිපත් වූ අයෙකි. ( )

18. පස්වන පනතට අනුව ශරීර සෞඛ්‍යයට අහිතකර ආහාර ලබාගැනීම සුදුසු ය. ( )

19. වෙනත් දෙවිවරු ඇදහීමෙන් පළමු පනත පූර්ණත්වයට පත් වේ. ( )

20. දේව සබැඳියාව පළුදු වන සෑම අවස්ථාවකදී ම සමගි සන්ධානය දේව ප්‍රසාද නිධානය ලැබිය යුතුය.

( )

(ලකුණු 2 x 5 = 10)

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. (1) දිව්‍ය සත්ප්‍රසාද පිළිවෙතෙහි බාහිර සලකුණු 02 ක් නම් කරන්න.
    (2) ප්‍රසාද ස්නාපනයේදී භාවිතා වන සංකේත 02 ක් ලියන්න.
    (3) රෝගීන්ගේ ආලේපය ලැබිය යුතු අවස්ථා 02 ක් ලියන්න.
    (4) දේව ජනතාව ගොඩනැගීමට දායක වන දේව ප්‍රසාද නිදාන 02 නම් කරන්න.
    (5) දෙමව්පියන් වෙනුවෙන් දරුවන් සතු යුතුකම් 02 ක් ලියන්න.
    (6) දස පනතේ පළමු පනත හා දෙවන පනත නම් කරන්න.
    (7) කිතුනුවන්ට නියම වන ණය මංගල්‍යය දින 02 ක් ලියන්න.
    (8) පූජාප්‍රසාදි තුමන්ලාගේ සේවාවන් 02 ක් ලියන්න.
    (9) ජේසුස් වහන්සේ අනුගාමී වෙමින් සතුරන්ට සමාව දුන් පුද්ගලයන් 02 නම් කරන්න.
    (10) දස පනත බෙදෙන ප්‍රධාන කොටස් 02 නම් කරන්න. (ලකුණු 2 x 10 = 20)

02. (1) ඔබ දන්නා ශුද්ධවන්තයින් 02 ක් නම් කරන්න. (ල. 02)
    (2) බැබිලෝනිය රටේ සැබෑ වූ එකම දෙවියන් වහන්සේට වන්දනාමාන කළ ජුදෙව් ජාතිකයින් තිදෙනා ලියන්න. (ල. 03)
    (3) සැබෑ වූ එකම දෙවියන් වහන්සේට පමණක් වන්දනා මාන කිරීමට ඔබට කළ හැකි දේවල් 05 ක් ලියන්න. (ල. 05)

03. (1) සමගි සන්ධානය දේව ප්‍රසාද නිධානය ස්ථාපිත කළේ කව්ද? (ල. 02)
    (2) සමගි සන්ධානය දේව ප්‍රසාද නිධානයෙන් ලැබෙන වරප්‍රසාද 03 ක් ලියන්න. (ල. 03)
    (3) සමගි සන්ධානය දේව ප්‍රසාද නිධානය ලබා ගැනීමේ පියවර ගණන පිළිවෙලින් ලියා දක්වන්න.(ල. 05)

04. (1) දේව ප්‍රසාද නිධානයක අඩංගු ලක්ෂණ 02 ක් නම් කරන්න. (ල. 02)
    (2) එක් වරක් පමණක් ලබාගත හැකි දේව ප්‍රසාද නිධාන 03 ලියන්න. (ල. 03)
    (3) නිසි වයසේ දී දේව ප්‍රසාද නිධාන නොලබන මිතුරෙකුට ඔබ ලබා දෙන උපදෙස් 05 ක් ලියන්න. (ල. 05)

05. (1) අභිවෘද්ධි ආලේපය පිළිබඳ කරුණු 02 ක් දක්වන්න. (ල. 02)
    (2) ප්‍රසාද ස්නාපනයෙන් ලැබෙන වරප්‍රසාද 03 ක් ලියන්න. (ල. 03)
    (3) ලන්චියානෝ නුවර දිවය සත්ප්‍රසාදිය ප්‍රාතිහාර්ය පිළිබඳව 1978 දී කළ පර්යේෂණයේ ප්‍රතිපල 05 ලියන්න. (ල. 05)

06. (1) ''එබැවින් දෙවියන් වහන්සේ එක් කළ අය මනුෂ්‍යයා වෙන් නොකෙරේවා'' මෙම ප්‍රකාශය සිදු කරන ලද්දේ,
    i) කව්රුන් විසින් ද? ii) කා හටද ? (ල. 02)
    (2) පූජා ප්‍රසාදි තුමන්ලාගේ කාර්යය සාර්ථක කර ගැනීම සඳහා ඔබට සහය විය හැකි අවස්ථා තුනක් ලියන්න. (ල. 03)
    (3) දේව කැඳවීම විරල මෙවන් යුගයක ශු. සභාවේ වගකිම් දැරීමට අප තරුණ තරුණියන්ට දේව වරම් බහුලව ලැබේවා යි අයදිමින් යැදුමක් සකස් කරන්න. (ල. 05)

07. (1) ඉරු දින දිව්‍ය පූජාවේ ඇතුළුවීමේ ගීතිකාව සඳහා යොදා ගත හැකි ගීතිකා 02 ක් නම් කරන්න.(ල. 02)
    (2) සබත් දිනයේ දී අප විසින් නොකළ යුතු කාර්යයන් 03 ක් ලියන්න. (ල. 03)
    (3) තෙවෙනි පනතට අනුව දෙවියන් වහන්සේට අපගේ කෘතඥතාව පෙන්නුම් කළ හැකි මාර්ග 05 ක් ලියන්න. (ල. 05)

06 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය 2025 | කතෝලික ධර්මය

## පිළිතුරු පත්‍රය - I කොටස

01. ( 2 ) 02. ( 1 ) 03. ( 3 ) 04. ( 4 ) 05. ( 2 ) 06. ( 4 ) 07. ( 3 ) 08. ( 1 ) 09. ( 4 ) 10. ( 3 )

11. අභිවෘද්ධි ආලේපය 12. පෙන්තකොස්ත දින 13. ගීතිකා කණ්ඩයමට එක් වීම

14. යාච්ඤාව 15 පාස්කු අභිරහස 16. ( x ) 17. (✓) 18. ( x ) 19. ( x ) 20. (✓) (ලකුණු 2 x 20 = 40)

## II කොටස

01. (1) පූප සහ මිදියුෂ

(2) ජලය, ශු. තෛලය, සුදු ඇඳුම, පාස්කු ඉටිපහන

(3) ♦ බරපතල ලෙස රෝගීව සිටින විට ♦ බරපතළ ශෛල්‍යකර්මයකට පෙර

♦ මරණාසන්න මොහොතක දී (පිටු අංක 51)

(4) පූජාත්වරය, ආශිර්වාදකාර බන්ධනය

(5) පියාගේ මහලු වියේදී ආධාර කිරීම. මව කෝප නොකිරීම.

සියළු කාරණාවලදී දෙමව්පියන්ට කීකරු වීම. (පිටු අංක 56)

(6) පළමු පනත - සැබෑ වූ එකම දෙවියන් වහන්ස්ට පමණක් වන්දනා කිරීම.

දෙවන පනත - දෙවියන්ගේ ශ්‍රී නාමය ගැන බොරුවටත් නිරන්තරයටත් නොදිව්රන්න.

(7) සෑම ඉරුදිනක්ම

ජනවාරි 01 - පරිශුද්ධ දේව මාතාවන්ගේ මංගල්‍යය

දෙසැම්බර් 08 - දෙව් මවුන්ගේ නිර්මල පිළිසිඳීමේ මංගල්‍යය (පිටු අ. 70)

(8) සුවිශේෂය දේශනා කිරීම.

සැබෑ එඬේරෙකු වීම.

දිව්‍ය පූජාව පැවැත්වීම. (පිටු අ. 54)

(9) ශු. ස්තේපන් මුනිතුමා, ශු. දෙවන ජුවාම් පාවුළු මුනිතුමා

(10) 1 - 3 මිනිසා හා දෙවියන් වහන්සේ අතර ඇති සම්බන්ධතාවය

4 - 10 මිනිසා හා තම අසල්වැසියන් අතර ඇති සම්බන්ධතාවය

02. (1) ශු. අන්තෝනි මුනිතුමා, ශු. සෙබස්තියන් මුනිතුමා, ශු. සන්තියානු මුනිතුමා ... ආදීන්.

(2) ෂද්‍රක්, මේෂක්, අබෙද්නෙගෝ

(3) ♦ දෙවියන් වහන්සේ මත පමණක් විශ්වාසය තැබීම.

♦ අන්‍යාගමික වත්පිළිවෙත්වලට සහභාගී නොවීම.

♦ හූනියම්, බලි තොවිල්, දෙහි කැපීම්... ආදි මිත්‍යා මත ප්‍රතික්ෂේප කිරීම.

♦ විභාග අවස්ථාවලදී අන්‍යාගමික ස්ථානවලට බාරහාර නොවීම.

♦ රූප වන්දනාව ප්‍රතික්ෂේප කිරීම... ආදී ගැලපෙන පිළිතුරුවලට ලකුණු ලබා දෙන්න.

03. (1) ජේසුස් වහන්සේ, පාස්කු ඉරුදින සවස

(2) ශු. සභාව සමඟ සමගි වීම.

සදාතන දඬුවමින් මිදීම.

දෙවියන් වහන්සේ හා සමගි වීම.... (පිටු අ. 50)

(3) ♦ තමාගේ පව් සිහි කිරීම. ♦ ඒවාට දුක් මනස්තාපනය වීම.

♦ මින් මතු පව් නොකරන්නට ඉටා ගැනීම. ♦ පව් සියල්ලම පියතුමාට දනවා සිටීම.

♦ පියතුමා නියම කරන දඬුවම් ඉටු කිරීම.

04. (1) ඇතුළතින් ලබා දෙන දේව වරප්‍රසාද ලබා දීම.

බාහිරින් එය සලකුණු කිරීම. (පිටු අ. 37)

(2) ප්‍රසාද ස්නාපනය

අභිවෘද්ධි ආලේපය

පූජකවරය

(3) සිසුවා ලියා ඇති පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න.

05. (1) පරිණත කිතුනුවන් ලෙස සාක්ෂි දැරීමට හැකි වේ.
ප්‍රසාද ස්නාපනයෙන් ලද නව ජීවිතය ශක්තිමත් වේ.

(2) ශු. සභාවේ සාමාජිකත්වය
දේව දරුකම
සුරලොවේ හිමිකරුවකු වීම. (පිටු අ. 43)

(3)
- මස් කැබැල්ල හා රුධිරය සැබවින්ම මනුෂ්‍යයෙකුගේ බව හා මස් කැබැල්ල මිනිස් හදවතකින් ගත් එකක් බව.
- මස් කැබැල්ලක්, රධිරයේත්, අඩංගු රුධිර වර්ගය AB පොසිටිව් බව.
- ශරීරයකින් අලුතින් ලබාගත් රුධිරයක මෙන් ප්‍රෝටීන් හා ඛනිජ වර්ග රුධිරයෙන් ඉවත් නොවී දිගමට පැවතීම.
- මස් කැබැල්ලට හා රුධිරයට කිසිම කල් තබා ගැනිමේ ද්‍රව්‍යයක් යොදා නොමැති බව.
- ශතවර්ෂ 12 ට අධික කාලයක් පරිසරයට නිරාවරණය වුවද මෙම මස් කැබැල්ල හා රුධිරය නරක් නොවී තිබීම.

06. (1) දෙවියන් වහන්සේ, ආදම් සහ ඒවට

(2)
- පූජා උදව්වන දරුවෙකු ලෙස
- ගීතිකා කණ්ඩායමට එක්වීම
- දේවස්ථානය සුද්ද පවිත්‍ර කරමින්
- දේව ප්‍රකාශන, විශ්වාසිකයින්ගේ යැදුම් කියවමින්.

(3) සිසුවා ලියා ඇති යාච්ඤාව සලකා බලා ලකුණු ලබා දෙන්න.

07. (1) අහස පොළොව, එක සිතින්, විමන් දොරටු .... ආදී ඇතුලත්වීමේ ගීතිකා

(2) දිව්‍ය පූජාව අතපසු කිරීම.
ඉරුදින අනවශ්‍ය ලෙස මුදල් ඉපයීමේ කාර්යයන්හි නිතර වීම.
අසංවර විලාසිතාවන්ගෙන් දිව්‍ය පූජාවට පැමිණීම. උපකාරක පංතිවලට සහභාගී වීම. (පිටු අ. 71)

(3) ඉරුදිනත් ණය මංගල්‍ය දිනත් මුළු දිව්‍ය පූජාවට ක්‍රියාශීලීව සහභාගී වීම.
දහම් පාසලට සහභාගී වී දෙව්පියාණන් වහන්සේ ගැන දැනුම වැඩි කර ගැනීම.
තම පවුල තුළ එකමුතුකම වර්ධනය කර ගැනීමට අවස්ථා සොයා ගැනීම.
රෝගී වූවන් බැලීමට යාම.
අසරණයින්ට පිහිට වීම.

**II කොටස**

1 ප්‍රශ්නයට ලකුණු 2x10 = 20

2 - 6 වන ප්‍රශ්න සඳහා

| | | |
|---|---|---|
| (1) කොටස | - ලකුණු | 2 |
| (2) කොටස | - ලකුණු | 3 |
| (3) කොටස | - ලකුණු | 5 |
| | මුළු ලකුණු | 10 |